# යහ මඟ තනනු මැන අනුනද මෙනෙහි කොට

පරිසරයේ පිරිසිදුකම රැකගන්නට හැකිනම් සිතට ද සහනයක් සැලසෙන බව අපි කවුරුත් දනිමු. බුදුරජාණන් වහන්සේ පවා පරිසරය අගය කළ අවස්ථා බුදුසමයෙහි සඳහන් වී ඇත. එසේම බුද්ධචරිතය දෙස බලන විට පැහැදිලි වන කරුණක් නම්, බුදුරජාණන් වහන්සේගේ වැදගත් සිදුවීම් සියල්ලක්ම පරිසරය හා සම්බන්ධව සිදු වී ඇති බවයි. බෝසත් අවධියේදී රාජශ්‍රීය අතහැර බවුන් වැඩීම සඳහා පිටත්ව ගියේ නේරංජරා නදී තීරයටයි. එසේම උතුම් වූ බුද්ධත්වය පසක් කළේ ඇසතු රුකක් පාමුලදීය. එය බෝ ගස යන නමින් හැඳින්වේ. එසේම උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු වූයේ සල් ගස් දෙකක් අතර ය. මේ අනුව විමසා බැලීමේදී බුදුරදුන් පරිසරයට කෙතරම් සමීප සම්බන්ධතාවයක් දැක්වීද යන්න අමුතුවෙන් කිව යුතු නැත.

පරිසරය යනු එක් අංගයක් නොවන බව අපි කවුරුත් දනිමු. එනම්, ජීවීන්, ගස්වැල්, ඇළදොළ, ගංගා, කඳුහෙල් ආදිය මෙහි ඇතුළත් අංගයෝය. මේවාද විද්‍යාත්මකව කොටස් කීපයකට බෙදී යයි. එනම් භෞතික පරිසරය හා සංස්කෘතික පරිසරය යනුයි. මෙහි භෞතික පරිසරය යනු ස්වභාවිකව හටගත්තාවූ පරිසරයයි. වනාන්තර, ජීවීන්, ගහකොළ යනාදිය මීට උදාහරණයි. එසේම සංස්කෘතික පරිසරය යනු මිනිසා විසින් තමන්ගේ අවශ්‍යතාව මත වෙනස් කරණ ලද පරිසරයයි. නගර, ගේදොර, පාරවල්, ආදී වූ දෑය. බුදුදහමට අනුවද ඇතැම්හු පරිසරය, ආධ්‍යාත්මික පරිසරය සහ භෞතික පරිසරය යනුවෙන් කොටස් දෙකක් ලෙස දක්වති. මෙහි ආධ්‍යාත්මික පරිසරය යනු සිත සහ සිතුවිලිවල ස්වභාවයයි. එසේම භෞතික පරිසරය යනු ඉහතින් පෙන්වා දුන් පරිදිමය. සමස්තයක් වශයෙන් ආධ්‍යාත්මික පරිසරයේත්, භෞතික පරිසරයේත් පිරිසිදුකම බුදුදහම අගය කරයි. බුද්ධදේශනාව තුළ බහුල වශයෙන් දක්වෙන්නේ ආධ්‍යාත්මික පරිසරයේ පිරිසිදුකම පිළිබඳවයි. එසේ නමුත් භෞතික පරිසරයේ පිරිසිදුකම පිළිබඳව ද බුදුදහම නිහඬ පිළිවෙතක් අනුගමනය කර නැත. එයට හේතුව මානසික සංවර්ධනයට භෞතික පාරිසරික සිද්ධීන්ද හේතු වන නිසාවෙනි. අපට බවුන් වැඩීමට සුදුසු පරිසරයක් තෝරා ගන්න යැයි බුදුරදුන් උපදෙස් දී ඇත්තේ මේ නිසා විය යුතුය. නොයෙක් අයුරින් දූෂිත වූ ස්ථානයන්හි සිට මානසික සංහිඳියාවක් ඇති කර ගැනීම අපහසු බව අපි කවුරුත් දනිමු. එබැවින් භෞතික පරිසරය පිළිබඳව ද අපගේ අවධානය අනිවාර්යයෙන්ම යොමු විය යුතු බව මෙහිදී අවධාරණය කළ හැකිය.

පරිසරයෙන් අනිසි අයුරින් පල නෙලා ගැනීමට ගොස් ආධ්‍යාත්මික පරිසරයත්, භෞතික පරිසරයත් විනාශ වූ බව අග්ගඤ්ඤ සූත්‍රයෙන් මැනවින් දත හැකිය. එහි සඳහන් ආකාරයට රසපෘථිවියට ගිජු වීම නිසා ඒවායෙහි විනාශයත්, බදාලතා නමැති වැල්වලට ගිජු වීම නිසා ඒවායෙහි විනාශයත්, ස්වයංජාත නම් වූ වී වර්ගයට ගිජුවීම නිසා ඒවායෙහි විනාශයත් ක්‍රමිකව සිදු වූ බව එහි සඳහන් වේ. එපමණක් නොව, ආධ්‍යාත්මික පරිහාණියත් ඒවා නිසාම සිදු විය. සොරකම් කිරීම, බොරුකීමාදිය මේ සම්බන්ධයෙන් දක්විය හැකිය. එබැවින් පරිසරයට ගිජු වීම නිසා අනිසි අපල අපට භුක්ති විඳීමට සිදු වේ. එය තණ්හාව නිසා සිදුවන්නකි. නමුත් පරිසරය රැක ගත යුත්තේ තෘෂ්ණාව නිසා නොව ඒවායෙහි ප්‍රයෝජන අපට අවශ්‍ය වන හෙයිනි. මූලික වශයෙන් වනාන්තර විනාශ කිරීම නිසා අපට අද භුක්ති විඳින්නට සිදු වී ඇති ප්‍රතිඵල ගැන අමුතුවෙන් කිව යුතු නැත. නිවසක් තැනීමට වේවා, ආයතනයක් තැනීමට වේවා, නොයෙක් අයුරින් පරිසරයේ ස්වභාවිකව වැඩෙන ගස් ටික කපා දැමීම නිසා හුස්ම ගැනීමටවත් නොහැකි පරිසරයක් මේ වන විට නගරවලින් ද, නොයෙක් ගම්වලින් ද නිර්මාණය වී ඇත. එයට ප්‍රධාන හේතුව නම්, 'ගස් කැපීම' පමණක් සිදුවන විට ඒවායේ සංවර්ධනයට ක්‍රමික වැඩ පිළිවෙළක් නොමැති වීමයි. එබැවින් සමහර රටවල වාහන මත පැළැටි සෑදීමට සිදු වී තිබෙන බව පෙනී යයි. ඒ ස්වභාවික පරිසරය විනාශ වී ඇති බවට එක් සාධකයක් පමණි. කෙසේ නමුත් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ගස් කැපීමට තහනම් කරණ ලද කථාපුවතක් විනය පිටකයට අයත් පාචිත්තියපාළියේ භූතගාමශික්ෂාපදයෙන් පැහැදිලි වේ. ඒ කථාව කෙටියෙන් මෙසේය.

අමාමෑණී බුදුපියාණන් වහන්සේ අළවුපුරයෙහි වාසය කරන සඳ, අග්ගළව නම් වූ සෑයෙහි භික්ෂූන් වහන්සේලා කුටියක් කරනු කැමතිව ගස් කපති; කපවති. එක් භික්ෂූන් වහන්සේ නමක් ගසක් කැපීමට විටෙක ආරම්භ කළේය. එවිට එම ගසට අරක්ගත් දෙව්දුවක් මෙසේ ප්‍රකාශ කළාය. "

ස්වාමීනි, තමාට නිවසක් කරනු කැමතිව මාගේ නිවස සිඳින්න එපා" යනුවෙනි. නමුත් ඒ භික්ෂුව එයට ඇහුම්කන් නොදී ඒ ගස සිඳිනුයේ ඒ දෙව්දුවගේ දරුවාගේ බාහුව ද සින්දේය. එකල්හි දෙව්දුවට මෙසේ සිත්විය. "මම මේ මහණව මරන්නේ නම් හොඳයි" යනුවෙනි. නමුත් ඇය එය කිරීම නුසුදුසු බව සිතා "එම කරුණ බුදුරදුන්ට දන්වන්නේ නම් මැනවි"යි සිතා බුදුරජාණන් වහන්සේ වෙත එළැඹ ඒ කරුණ උන්වහන්සේට සැළ කළාය. එවිට භාග්‍යවතුන් වහන්සේ දෙව්දුව විසින් යම් හෙයකින් භික්ෂුව මරණයට පත් කළා නම් එයින් බොහෝ පව් සිදු වන බව ද දේශනා කොට, ඇයගේ ක්‍රියාව "සාධු සාධු" (මැනවි, මැනවි) යැයි අගය කොට ඇයට වසනට දෙවියන්ගෙන් හිස් වූ රුකක් පෙන්වා එහි වාසය කරන ලෙස අවවාද කළ සේක. ඉන් පසු භික්ෂූන් වහන්සේලාගේ මෙම ගස් කැපීමේ ක්‍රියාවට දෝෂාරෝණය කරන්නට වූයේ පොදු ජනතාවයි. එම ක්‍රියාව මිනිස්සු පහත් කොට සිතුහ; භික්ෂූන්ට බැන්නාහුය. මේ පුවත බුදුරදුන්ට සැළ වූ විට බුදුරදුන් එම භික්ෂූන් වහන්සේලා කැඳවා එම සිද්ධිය සත්‍ය වුවක්දැයි විමසූ සේක. භික්ෂූන් වහන්සේලා එසේ කළ බව පැවසූහ. පසුව භික්ෂූන් වහන්සේලාට බුදුරදුන් දෝෂාරෝපණය කොට එසේ මින් පසු නොකළ යුතු බව පවසා විනය ශික්ෂාපදයක් ගෙනහැර දක්වූ සේක. එහිදී භික්ෂූන් වහන්සේලා විසින් නොකැපිය යුතු ගස්වර්ග, පැළවර්ග ද නම් කළ සේක. එනම්, ඒවා නම් **මූලබීජ** ගණයෙහිලා ගැනෙන කහ, ඉඟුරු, වදකහ ආදීයත්, **ඛන්ධබීජ** ගණයෙහිලා ගැනෙන ඇහැටු, නුග, දිඹුල් ඈ ගස්වර්ගත්, **ඵළුබීජ** ගණයෙහිලා ගැනෙන පුරුක්වලින් සෑදෙන උක්, උණ, ඈ ගස් වර්ගත්, **අග්ගබීජ** ගණයෙහිලා ගැනෙන අඳුතලා, මුරුවා, ඉරිවේරිය ඈ පැළ වර්ගත්, **බීජබීජ** ගණයෙහිලා ගැනෙන හැල් වී, මුං, ඈ ඇටවලින් සෑදෙන ගස්වර්ගත් ය. මෙසේ සඳහන් කළ දෑ යමෙක් සිඳින්නේ නම් ඔහුට පාචිත්තිය නමැති ඇවැත සිදු වේ.

මේ සිද්ධිය දෙස බැලීමේදී භික්ෂූන් වහන්සේලා විසින් පරිසරයේ ස්වභාවිකව වැඩෙන ගස් කෙරෙහි කෙතරම් අවධානයක් යොමු කළ යුතුද යන්න පැහැදලි වේ. මෙයින් ගත හැකි ආදර්ශය නම් බුදුදහමෙහි එන පරිසර සංරක්ෂණය, පොදු කාර්යයක් වශයෙන් සැලකීමට හැකි වේ නම්, පරිසරය කෙතරම් දුරට ආරක්ෂා කළ හැකි ද යන්නයි. සැබවින්ම, බහුතරයක් ගස්වැල් ආදිය කපා විනාශ කරන්නේ ගිහි ජනතාවයි. ඒ අයගේ වගකීමක් වන්නේ ගස් කැපීම අවම කිරීමත්, එසේම එසේ සිදු කරන්නේ නම් ඒවාට ප්‍රතික්‍රියා වශයෙන් ගසක් රෝපණය කිරීමත්ය. එසේ නොවන විට ස්වභාව ධර්මය විපරියාස ලක්ෂණයන්ට භාජනය වේ. එවිට වාතය දූෂණය වීම ක්‍රමිකව සිදු වේ. හුස්ම ගැනීමට පවා අපහසු තත්ත්වයකට අපට මුහුණ දීමට සිදු වේ. ගස්වැල් ආරක්ෂා කිරීම අප කාගෙත් වගකීමකි. එසේ නොවන තැන ඒවායේ ප්‍රතිඵල අපට නුදුරු අනාගතයේදී විඳීමට සිදු වේ. එනිසා පරිසරය හානියට සමස්තයම වගකිව යුතු බව මතක තබා ගැනීම වැදගත් වේ.

තවද ජලය යනු ස්වභාවික සම්පතක් බව අපි සැවොම දනිමු. මෙම ජලය නිසා කොතරම් ගැටළුවලට මුහුණ පාන්නට සිදුවී ද යන්න සමීපාතීතයේ සිදු වූ ජල ගැටළුව පිළිබඳ අපි කවුරුත් දනිමු. එනම්, ජලය අපගේ ජීවිතයට කෙතරම් වැදගත් දෙයක් ද යන්න කල්පනා කළ යුතුමය. අපගේ ශරීරයේ වැඩි කොටසක් ඇත්තේ ජලය බව සාමාන්‍ය දැනීමකි. බුදුරදුන් භික්ෂූන් වහන්සේලාට ජලය සම්බන්ධයෙන් ද කරුණු දේශනා කළ සේක. අංගුත්තර නිකායට අයත් සුත්තනිපාතපාළියේ එන කසීභාරද්වාජ සූත්‍රයෙහිදී බුදුරදුන් කසීභාරද්වාජ බමුණාට දහම් දෙසූ විට ඔහුට අයත්ව තිබූ කිරි ආහාරය බුදුරදුන්ට පිළිගැන්වීම සූදානම් වූයේ බුදුරදුන්ගේ දේශනාවිලාශයට පැහැදීමෙනි. ගාථාවන් දේශනා කොට තමන් එම ආහාරය නොගන්නා බව පැවසූ බුදුරදුන් වැදගත් ප්‍රකාශයක් සිදු කරණුයේ බමුණා විසින් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙනි. ඔහු විසින් "ස්වාමීනි, මෙම කිරි ආහාරයට කුමක් දැන් කළ යුතුද"යි විමසූ විට එම ආහාරය තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේ හැර කිසිවෙකුටත් ජීරණය නොවන බව පෙන්වා දුන් අතර, එම ආහාරය තණකොළ බහුල නොවූ තැනක හෝ ප්‍රාණීන් නැති දියෙහි හෝ දමන්න යැයි දේශනා කළ සේක. එම ප්‍රකාශයෙහි දක්වෙන 'අප්පහරිතෙ', 'අප්පාණකෙ' යන පදද්වය සම්බන්ධයෙන් අටුවා දක්වා ඇති අදහස ද මෙහි වැදගත් වේ. එනම් 'අප්පහරිතෙ' යනු "අප්පහරිතෙති පරිත්තහරිතතිණෙ, අප්පරුළ්හරිතතිණෙ වා පාසාණපිට්ඨිසදිසෙ" යනුවෙන් දක්වේ. එහි අදහස් දෙකකි. එනම් "අල්ප වූ නිල් තණ ඇති ස්ථානයක හෝ අල්ප ලෙස හටගත් නිල් තණ ඇති ස්ථානයක හෝ ගල් තලාවක් මතුවෙහි" යන අදහස් ඉන් ලැබේ. එසේම 'අප්පාණකෙ' යන්නට අරුත් සපයා ඇත්තේ "අප්පාණකෙති නිප්පාණකෙ, පායාසජ්ඣොත්ථරණකාරණෙන මරිතබ්බපාණරහිතෙ වා මහාඋදකක්ඛන්ධෙ" යනුවෙනි.

එයින් පෙනී යන්නේ 'අප්පාණකෙ' යන්නෙන් 'ප්‍රාණීන් රහිත තැන' අදහස් වන බවයි. මෙහි ඊළඟට දැක්වෙන අදහස නම් "කිරි ආහාරය දැමීම හේතුවෙන් මරණයට පත්වන ප්‍රාණීන් රහිත ස්ථානය හෝ මහත් වූ ජලස්කන්ධයක් ඇති ස්ථානය" යනුවෙනි. මෙයින් ගම්‍ය වන තවත් අර්ථයක් අටුවාවෙහි දක්වා ඇත. එනම් තණකොළ සහ ප්‍රාණීන් යන දෙපක්ෂයේම ආරක්ෂාව පිණිස මෙසේ කිරීමට උපදෙස් දී ඇති බවයි. ඒ අනුව බුදුරදුන් කුඩා වූ ප්‍රාණීන්ගේ පවා ආරක්ෂාව සම්බන්ධයෙන් සහ භෞතික පරිසරය සම්බන්ධයෙන් කටයුතු කළ බවත් පෙනී යයි. වත්මන් සමාජය තුළ මේ පිළිබඳ දැඩි තැකීමක් නැති බව පෙනී යන කරුණකි. තමන් පානය කරණ ජලය පිරිසිදු විය යුතු වුවත් අන් අය පානය කරන ජලය ගැන ඔවුනට ප්‍රශ්නයක් නැත. තමන්ගේ ආත්මාර්ථකාමීත්වය මෙයින් මනාව ප්‍රකට කිරීම විනා වෙන දෙයක් එහි නැත. අන් අය ගැන සිතීමට ඔවුනට ආත්මශක්තියක් නැති බව නම් කිව යුතුමය. එබැවින් බුද්ධිමත් ජනතාවක් වෙසෙන අප රටේ මිනිසුන්ගේ ඇස් දැන්වත් ජලය සම්බන්ධයෙන් විවර විය යුතුය. එසේ නොවන්නේ නම් ආයතනයන් නිසා සිදුවන ජල දූෂණය වැළැක්වීමට දෙවියන්ට වත් නොහැකිය. මිනිසුන් නිසා සිදුවන ජල දූෂණය වැළැක්වීමට දෙවියන්ටවත් නොහැකිය. පෙර රජවරුන් පවා රැක දුන් ජලසම්පත අහිමි කිරීමට නොව ආරක්ෂා කිරීමට සියලු දෙනාම උත්සුක විය යුතුමය. තමන් නිසා ජලය යම් විධියකින් අපවිත්‍ර වේදැයි කල්පනා කළ යුතුය. තවද බුදුරදුන් ජලය සම්බන්ධයෙන් විනය නීති පවා පනවා ඇති බව පාචිත්තියපාළිය තුළින්ම දත හැකිය. එහි හස්සධම්ම ශික්ෂාපදයේදී ජලයෙහි ක්‍රීඩා කිරීම භික්ෂූන් විසින් නොකළ යුතු බව දක්වා ඇත. එසේම ජලයට ගල්වලින්, දරකැබලි වලින් පහර ගැසීම පවා දුක්කටාපත්ති ඇවතකි. තවද වැදගත් කරුණක් ලෙස බුදුරදුන් විසින් පැන වූ ශික්ෂා පදයක් දැක්විය හැකිය. එනම්, යම්කිසි භික්ෂුවක් අගිලන්ව ජලයට මල මූ, පහ කරයි නම්, කෙළ ගසයි නම්, එහිදී දුක්කටාපත්තියක් (ඇවතක්) සිදු වේ. එසේම එසේ  මෙයින් බලාපොරොත්තු වූයේ ජලය කාටත් පොදුවේ භාවිත කළ හැකි වන පරිද්දෙන් සංරක්ෂණය කිරීමයි. ප්‍රාණීන් සහිත ජලයෙහි තණකොළ, මැටි ආදිය දමන්නේ නම් පාචිත්තිය ඇවැතක් බව විනය පිටකයෙන් පෙනී යයි. ජලය අපිරිසිදු වීම නිසා කොතරම් ලෙඩරෝග සිදුවන්නේ ද යන්න අපට විස්මය ජනක දෙයක් නොවේ. එසේ නම් බුද්ධදේශනාවට අනුව, රටකරවන ඇත්තනුත්, රටෙහි පොදු ජනතාවත් එකලෙසම ජලයෙහි පිරිසිදුභාවය අපේක්ෂාවෙන් කටයුතු කළ යුතුමයි. එය පරිසරයේ පිරිසිදුභාවය පිණිස පවතින්නකි.

තවද අප දන්නා පරිදි පරිසරය අපිරිසිදු වන අවස්ථා බොහෝමයක් ඇත. ගමනක් බිමනක් යන විට බොහෝ දෙනා බස් රථවලට ගොඩ වී බිස්කට් වර්ග කන අය, එය අවසන් වූ විට කවරය හෙවත් බෑගය ජනේලයෙන් ඉවතට දමා සුවසේ ගමන් කරති. ඔහුට හෝ ඇයට තමන් කළ ක්‍රියාව ගැනවත් අවබෝධයක් නොමැති වීම කණගාටුවට කරුණකි. පරිසර හානියක් තමන් විසින් සිදු කළ බවක් ඔහුට හෝ ඇයට තේරුම් ගැනීමට තරම් බුද්ධිමත්භාවයක් නොමැතිකම කණගාටුවට කරුණකි. එබැවින් ඊට වඩා සිතීමට පුරුදු විය යුතු බව එබඳු දෑ කරණ අයට සිහිපත් කරන්නෙමු. එසේම සිලි මලු ආදිය ද තමන්ගේ රථයෙන් ඉවත් කරනුයේ මහමගටයි. එය ද නොදැනුවත්කම ප්‍රදර්ශනය කිරීමකි. එබැවින් රටක පවිත්‍රතාවයට ජනතාව මූලික වශයෙන් වගකිය යුතුමයි. තමන්ගේ නිවස පවා පවිත්‍රව තබා ගැනීමට අපොහොසත් වී ඇති බව පෙනී යයි. එනිසාම මානසික තෘප්තියක් ඔවුනට ඇති නොවේ. සමහර ගෙවල් ඉතාමත් පිළිවෙළට පරිසරයට හිත පරිදි සකසා තිබීම අගය කළ යුත්තකි. සෞන්දර්යය රසාස්වාදය කිරීමේ ශක්තියක් ඔවුනට අනායාසයෙන්ම ලැබේ. එසේම මඳුරු වසංගතයන්ගෙන් වැළකීමට නම් තමන් පරිහරණය කරණ නොදිරණ දෑ ඉවත් කිරීමේදී ඒවාට සුදුසු ක්‍රමවේදයක් සකසා ගැනීම වැදගත් වේ. එසේ නොවන තැන නිවසම රෝහලක් වනවාට සැකයක් නැත. අවසානයේ කඳුළු පිරි දෙනෙත්වලින් මුළු ජීවිත කාලය පුරාවටම ඇතමුන්ට සිටින්නට සිදු වන්නේ ඩෙංගු වැනි රෝගයක් නිසා තමන්ගේ අය මිය යෑම හේතුවෙනි. ඊට පිළියමක් ලෙස පූර්ව සූදානමක් ඇති කරගත යුතුය. මඳුරුවාට බැණ බැණ සිටීම නුවණට හුරු දෙයක් නොවේ. ඌ සොයා එන්නේ ඌගේ ආහාරයයි. එබැවින් තම නිවසෙහි ඇති පරිසරය පිරිසිදුව තබා ගැනීමට නුවණැති ජනයා පියවරක් ගත යුතුය.

ලෙඩ රෝගවලින් මිදීමට නම් තමන් පරිහරණය කරණ සෑම දෙයක් පිළිබඳවම අවධානයෙන් සිටීම අවශ්‍ය වන කරුණකි. ඇතැම්හු පොදු දේපල පරිහණය කරණ නමුත් ඒවායෙහි යහ පැවැත්ම වෙනුවෙන් කටයුතු කරන්නේද යන්න පොදු වැසිකිළියකට ගිය විට තේරුම්ගත හැකිය. බොහෝ දුරට තමන් ඒවා පාවිච්චි කිරීමෙන් පසු පිරිසිදු කිරීමක් නොකරම පිටවී යයි. එය

නූගතුන්ගේ ක්‍රියාවක් ලෙස සැලකිය හැකිය. ලංකාවේ බොහෝ මගීන් ගැවසෙන තැන්වල පොදු පරිහරණය පිණිස වැසිකිළි ඉදි කොට ඇත්තේ එය මිනිසුන්ගේ අවශ්‍යතාවක් වන හෙයිනි. නමුත් ඒවා පාවිච්චියෙන් අනතුරුව වතුර දමා පිරිසිදු කිරීමක් නොකරම පිටවී යන්නේ නොදැනුවත්භාවය හේතුවෙනි. තමන්ගේ නිවසේදීවත් එම කාර්යය හරියට කරන්නේද යන්න සැකයක් මෙයින් ජනිත කරයි. එබැවින් ඒවායෙහි පිරිසිදුභාවය ආරක්ෂා කිරීම පොදු ජනතාවගේ වගකීමකි. බුදුරජාණන් වහන්සේ පවා වැසිකිළි කැසිකිළි පාවිච්චි කරණ අයුරු භික්ෂූන්ට පැහැදිලි කොට දී ඇත. "සචේ වච්චකුටි උක්ලාපා හෝති, වච්චකුටි සම්මජ්ජිතබ්බා" යනුවෙන් චුල්ලවග්ගපාළියේ වත්තක්ඛන්ධකයේ සඳහන් වේ. එයින් අදහස් කරන්නේ ඉදින් වැසිකිළිය අපිරිසිදු නම් එය ඇමදිය යුතු බවයි. එම ඉගැන්වීම්වල වටිනාකම අද දක්වාම නොනැසී පවතින්නේ එය සර්ව සම්පූර්ණ ප්‍රකාශයක් වන බැවිනි. තමන්ට අනතිමානී ගුණය ළඟා කර ගැනීමට මෙය මහඟු පිටිවහලක් සපයයි. එයින් පිනක් ද සිදු වෙයි. අන් අය පවා පාවිච්චි කරන වැසිකිළි කැසිකිළි ආදිය පිරිසිදු කිරීමට නැණවතුන්ට හැර කවරෙකුට හැකිද? එබැවින් වත්මන් සමාජය තමන් භාවිත කරණ වැසිකිළි කැසිකිළි පිරිසිදුව තැබීමට කටයුතු කළ යුතුය.

දියුණු වූ රටවල් බොහෝමයක් භෞතික සම්පත්හි පවිත්‍රත්වය අගය කරණ බව අපට පෙනී යයි. ඔවුන් නිතරම පරිසරය පිරිසිදුව තබා ගැනීමට කටයුතු කරණ බවක් දැකගත හැකිය. වැලි කැටයක් පවා සමහර රටවල පාරවල්වල දැකිය නොහැකි බව ප්‍රත්‍යක්ෂ කළ අය කියති. අපගේ රටෙහි තවමත් එබඳු පිරිසිදුකමක් නැති බව නම් සැබෑවකි. ඔවුන් බොහෝ විට පිරිසිදු කිරීමේ කාර්යය මාර්ගසෝධකයන්ගේ කාර්යයක් හැටියටම සලකති. නමුත් මහාචාර්යවරයාටත්, වෛද්‍යවරයාටත්, ඉංජිනේරුවාටත්, අනෙක් අද්විතීය ආයතනයන්හි සේවාකම් කරණ සේවකයන්ටත් පිරිසිදුකම තිබීම අවශ්‍යයි. යම් විටෙක මාර්ගසෝධකයන් හෙවත් මාර්ග පිරිසිදු කරණ පුද්ගලයන් වැඩ වර්ජනයක යෙදුණහොත් කිසිවෙකුටත් පාරේ බැස ගමන් කිරීම අපහසු බව දනිමු. එසේ හෙයින් උගත්කමේ එක් අංගයක් නම් පරිසරය ආරක්ෂා කර ගැනීමයි; පොදු දේපල ආරක්ෂා කර ගැනීමයි; පිරිසිදුව තබා ගැනීමයි. එයට පන්තිභේදයක් අවශ්‍ය නොවේ. අනුන් කරණ තෙක් බලා සිටීමට බොහෝ දෙනා පුරුදුව ඇත. එනිසාම ඇතැම් විට නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සිදු වී ඇත. ඇතැමුන් දඩ ගෙවීම්වලට පවා ලක්වන්නේ මේ නිසාවෙනි. එබැවින් තමන්ගේ ආයතනයත්, පාසලත්, නිවසත්, කඩයත්, සියලු පෞද්ගලික සහ පොදු ස්ථානත් පිරිසිදුව තබා ගැනීම සමාජයට කරණ සේවාවකි.

අවසාන වශයෙන් පැවසිය හැකි වන්නේ බුද්ධදේශනාව යනු හුදෙක් මානසික පිරිසිදුකම පමණක් නොව බාහිර පිරිසිදුකම අපේක්ෂා කළ දහමක් බවයි. භික්ෂූන් වහන්සේලාට තමන්ගේ කුටි පවා කෙසේ පිරිසිදුව තබා ගත යුතුද යන්න බුදුරදුන් තරම් දේශනා කළ දේශකයාණ කෙනෙක් නොමැති. පවිත්‍ර වූ තැනට දෙවිවරු පවා ප්‍රිය ය.  අපවිත්‍ර තැන ට ප්‍රිය වන්නේ මළ පෙරේතයෝ ය. එබැවින් තම නිවසෙහි පරිසරය පිරිසිදුව තබා ගැනීම ඔබ සතු වගකීමකි. ජලයෙහි පිරිසිදුකම තබා ගැනීම ඔබ සතු වගකීමකි. නගරයෙහි, ගමෙහි පිරිසිදුකම තබා ගැනීම ඔබ සතු වගකීමකි.  බුදුරදුන් විසින් භික්ෂූන්ට ඉඳුල් සහිත ජලය පවා ඇතුල් ගමෙහි හෝ ඇතුල් ගෙහි නොදැමිය යුතු යැයි දේශනා කොට ඇත්තේ එයින් යම් අපවිත්‍රතාවක් ඇතිවන බව අවබෝධ කරගත් හෙයිනි. එනිසා බුදුරදුන්ගේ දේශනාවට අනුකූලව සැකසීමට හැකිනම් අපගෙන් සමාජයට සේවයක් සිදු වන බව සිතීමට හැකිය. එසේ නොකරන්නේ නම් තමන්ගෙන් සමාජයට හානියක් වන බව සිතාගත යුතුය.

නිකසල සිතක් ඇතිවන්නට නම් ඔබට

කුසලක් කරනු මැන කසල ද ඉවත් කොට

යහ මඟ තනනු මැන අනුනද මෙනෙහි කොට

ඔබ හට හැකිවේවි ඉන් පිං ලබන්නට

මතුරට පඤ්ඤානන්ද හිමි,

විද්‍යෝදය පිරිවෙණ.